www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තෙල් අවීව් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය: සියොන්වාදයට හා අධිරාජ්‍යවාදයට වාසි ගෙන දෙන දාමරිකකමක්

## Tel Aviv suicide bombing: An atrocity that benefits Zionism and imperialism

**කර්තෘ මන්ඩලය විසිනි**

**2006 අප්‍රේල් 20**

සිය දිවි නසා ගත් තරුනයාට අමතරව අඩුම තරමේ තව නව දෙනකු බිලිගත් තෙල් අවීව් නුවර සැකසූ ආහාර (fast food) අලවි කරන ආපන ශාලාවක් අසල සඳුදා සිදු කල මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිසැක ලෙස ම හෙලා දකියි. මෙසේ අහිංසකයන් සාපරාධීව ඝාතනය කිරීම් මගින් ඊස්රායෙල් මර්දනයට හා වාඩි ලා ගැනීමට එරෙහි පලස්තීන ජනයාගේ අරගලය සඳහා කිසිවක් ඉටු නොකෙරේ. ඊට ප්‍රතිවිරුද්ධව, ත්‍රස්ත ක්‍රියාවන් ජනයා වික්ෂිප්ත කර නොමග යවා, ඊස්රායෙල් පාලනය හා එහි වොෂිංටන අනුග්‍රාහකයා යන දෙපස ම දේශපාලනිකව සවිමත් කරවා ධනපති ක්‍රමයට එරෙහිව යුදෙව් හා අරාබි කම්කරුවන්ගේ ඒකාබද්ධ අරගලයක් වර්ධනය කිරීම වඩාත් දුෂ්කර කරවයි.

දැන් පලස්තීන අධිකාරිය හොබවන හමාස් සංවිධානයේ ප්‍රකාශකයකු, "මෙය දිගින් දිගටම වන ඊස්රායෙල් ආක්‍රමනශීලිත්වයේ සහ උත්සන්නයේ ස්වාභාවික ප්‍රතිඵලයක් වන අතර එය සැලකියහැකි වනුයේ ආත්ම ආරක්ෂාවේ ස්වරූපයක් ලෙස පමනකි." යයි ප්‍රකාශ කරමින් බෝම්බ ප්‍රහාරය වෙනුවෙන් කථා කලේ ය. තවත් නිලදරුවකු වන අභ්‍යන්තර කටයුතු පිලිබඳ ඇමති වන සහීඩ් ශ්‍යාම් වාර්තාකරුවන්ට පැවසුවේ: "අප ගුවන් යානා හා මිසයිලවලට මුහුන දිය හැකි මහ බලවතෙකු නොවන නමුත් අපේ ජනයාට තමන් ආරක්ෂා වීමේද තමන්ට හැකි පමනින් ආක්‍රමනයේ උද්ධච්ච කමට මුහුන දීමේ දී අධිෂ්ඨානය හා අයිතිය තිබේ" යනුවෙනි.

බටහිර ඉවුරේ පලස්තීන ජනයා මත වන සියොන්වාදී ආක්‍රමනයේ කෲර තර පීඩනය මෙන්ම ඊස්රායෙලය ඉවත්වීමෙන් පසුව දිගින් දිගට ම පවතින ගාසා තීරය වටලා ගෙන සිටීම ද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන්ගෙන් ප්‍රකාශයට පත්වන මහා වදවේදනාවක් හා සන්තාපයක් නිර්මානය කරවා තිබෙන බව ඒකාන්තයෙන් ම සත්‍යයකි. එහෙත් අව්‍යාජ විප්ලවවාදී නායකත්වයක කර්තව්‍යය වන්නේ එවන් ආත්ම පරාජකවාදී ක්‍රියාවන් ඔසවා තැබීම හෝ යුක්ති සහගත කිරීම හෝ නොව විකල්ප සහ ප්‍රතිඵලදායී අරගලයේ මාවතක් ඉදිරිපත් කිරීම ය.

ප්‍රන්ස සංචාරකයකු, රුමේනියානු සංක්‍රමනිකයන් දෙදෙනකු, දරු උපතක් නිසා රෝහලකට කඩිනමින් යමින් සිටි යුදෙව් තරුනයකු, සිය සැමියා සහ දරුවන් ඉදිරියේ මරා දැමුනු යුදෙව් කාන්තාවක, මැදි වියේ වූ ආරක්ෂකයකු (ජනවාරියේ මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් අනතුරුව සේවයේ යෙදවූවෙකි), වයසක මිනිසකු සහ ෆලාෆෙල් හා ශ්වර්මා කඩපිලේ කටට යමක් දාගෙන යාමට මදකට නතර වූ තව යුදෙව් කම්කරුවන් දෙදෙනකු ආදී වන අහිංසක ජීවිත නවයක් විනාශ කිරීමෙන් පලස්තීන ජනයා 'ආරක්ෂා' කරන්නේ කෙසේ ද?

මෙය මිලිටරි ඉලක්කයක් වත් පලස්තීන භූමිය සන්නද්ධ බලයෙන් ඩැහැගෙන සිටින ෆැසිස්ට්වාදී පදිංචිකරුවන් කන්ඩායමක් වත් නොවේ. පුවත්පත් වාර්තාවන්ට අනුව ඉලක්කය, "නිල් කරපටි ඊස්රායෙල් වරු හා සංක්‍රමනික කම්කරුවන් අතර ජනප්‍රිය වූ ආපනශාලාවක්" වන අතර හානිය උපරිම කරවනු සඳහා බෝම්බය පිපිරවීම දිවා ආහාර පැයට කාල මාන කර තිබුනි.

ලන්ඩනයේ *ටයිම්ස්* පුවත්පතේ වාර්තාවක ආපනශාලාවේ සේවය කල පැරනි සෝවියට් සමූහාන්ඩුවට අයත් ජනරජයක්ව පැවැති අසර්බයිජානයෙන් සිය පවුල් පිටින් ඊස්රායෙලයට සංක්‍රමනය වූ ජාතුන් ඉස්මයිලොව් සහ ඩේවිඩ් මැන්ශිරොව් යන 17 වියැති තරුනයන් දෙදෙනා සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා ඇතුලත් කර තිබුනි. දෙදෙනම ජනවාරි බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලබා යලි සේවයට පැමින තුබූ අතර අප්‍රේල් 17 ප්‍රහාරයේ දී වඩාත් බරපතල ලෙස තුවාල සිදු වී තිබේ. එක ලඟ වූ රෝහල් ඇඳන්වල සිටින දෙදෙනාව *ටයිම්ස්* පුවත්පතින් සාකච්ඡාවට ගෙන තිබුන අතර සුවවීමෙන් අනතුරුව යලි රැකියාවට පැමිනෙන බව දෙදෙනම ප්‍රකාශ කර

තිබුනේ, ඉස්මයිලොව් විස්තර කල පරිදි "ගෙදර ආර්ථික තත්වය අයහපත්" නිසා ය. කෝකියකු වන මැත්ශිරොව් "මම වැඩ නොකලොත් කව්ද ගෙවල් කුලී ගෙවන්නේ?" යනුවෙන් පැවසී ය.

ඒ ලඟට බෝම්බකරුවන්ගේ ඉරනම පිලිබඳ කාරනාව ද තිබේ. සැමි හමෙඩ් ගේ ස්වයං විනාශය සහ තුන් මසකට ඉහත තවත් පලස්තීන තරුනයකු ගේ දිවි නසා ගැනීම පලස්තීන ජනයා ආරක්ෂා කර ගැනීමට දායක වන්නේ කෙසේ ද? තමන්ගේ ජීවිත ආරම්භ කලා පමනක් වන මෙම තරුනයන්ට පලස්තීන සමාජයේ ද සමස්තයක් ලෙස මානවයාගේ ද සංවර්ධනය වෙනුවෙන් කවරනම් දායකත්වයක් කල හැකිව තිබුනේ දැයි කිසිවෙක් නොදනිත්. ඒ වෙනුවට හමෙඩ්ගේ පවුලේ උදවිය, ජෙනින් අසල සිය නිවස බුල්ඩෝසර් කරනු, දුසිම් ගනන් පලස්තීනුවන් අත් අඩංගුවට ගනු සහ බටහිර ඉවුරේ සියොන්වාදී පොලිස් රාජ්‍යය සිය ග්‍රහනය දැඩි කර ගනු නිසැකව ම දකිනු ඇත.

නින්දාශීලී ලෙස "සාම ක්‍රියාදාමය" යයි වරදවා නම් කෙරුන ඔස්ලෝ එකඟතාවයේ 13 වසරකට පසුව, සියලු ප්‍රධාන පලස්තීන කන්ඩායම්වල ප්‍රතිචාරය එකිනෙකට වෙනස් ආකාරයන්ගෙන් ධනේශ්වර ජාතික ව්‍යාපාරයේ නිසරු බව ස්ථිර කර තිබේ. ඔස්ලෝව ප්‍රතික්ෂේප කරන හෝ එය පිලිගන්නා හෝ එකදු කන්ඩායමක් වත් පලස්තීන ජනයාට ඉදිරි මාවතක් නොපෙන්වයි.

ඔස්ලෝව සහ ඊශ්‍රායෙලය සමග වන වර්තමාන සටන් විරාමය, යන දෙකම ප්‍රතික්ෂේප කරන ඉස්ලාමික් ජිහාඩ් සංවිධානය, ජෙනින් අසල උතුරුදිග බටහිර ඉවුරේ ක්වබටියා ගම්මානයෙන් පැවතෙන්නකු වූ 21 හැවිරිදි හමෙඩ් විසින් ක්‍රියාවට නංවනු ලැබූ ප්‍රහාරයේ වගකීම බාර ගනිමින් ප්‍රකාශයක් නිකුත් කලේ ය. පිපුරුමෙන් පැය කීපයක් ඇතුලත ඉස්ලාමික් ජිහාඩ් සාමාජිකයෝ සිය ප්‍රතිගාමී ඉස්ලාමීය දෘෂ්ටිවාදය ඉහල නංවනු පිනිස මෙම තරුනයාගේ ස්වයං විනාශය පාවිච්චි කරමින් ඔහුගේ වීඩියෝ පට බෙදා හැරියේ ය.

ඔස්ලෝ ගිවිසුම ප්‍රතික්ෂේප කල ද, දිගු කලක සිට පලස්තීන විමුක්ති සංවිධානයේ ආධිපත්‍යය දැරූ අනාගමික ජාතිකවාදී පක්ෂය වූ ෆාටාව පරදවා ජනවාරියේ ඔවුන් ලැබූ මැතිවරන ජයට මග පෑදූ ප්‍රාදේශීය සංවිධාන කටයුතුවලට හා සුබසාධන ක්‍රියාවන්ට යොමු වීම පිනිස පසු ගිය වසර මුලුල්ලේ ඊශ්‍රායෙල අධිකාරීන් සමග අප්‍රකාශිත සටන් විරාමයක් පවත්වා ගෙන යාමට එලඹුනු ප්‍රධාන ඉස්ලාමීය මූලධර්මවාදී පක්ෂය වන හමාස්වරුන්ට ඉස්ලාමීය ජිහාඩ්වරු සමග ඇත්තේ උපක්‍රම පිලිබඳ මතභේද පමනි.

හමාස්වරු නොසැලෙන සටන්කාමීත්වයක් නියෝජනය කරනවා නොව සියොන්වාදීන් හා ඇමරිකානු අධිරාජ්‍යවාදීන් සමග ගනුදෙනුවක් කර ගැනීම සඳහා මරාගෙන මැරෙන බෝම්බකරුවන් කේවලේට තබනවා පමනකි. හමාස්වරු නායකත්වය දෙන පලස්තීන අධිකාරියේ ප්‍රකාශකයකු වන ගාසි හමෙඩ් බදාදා සීඑන්එන් සේවයට ප්‍රකාශ කල පරිදි, "ඊශ්‍රායෙලය දැන් අපගේ ජනයාට එරෙහි සියලු වර්ගයේ ප්‍රහාර සහ ආක්‍රමන නවතා දැමීමට සූදානම් නම් අපට එහි තත්වයද සංසුන්ව තැබීමට පුලුවන."

මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ල කිරීමෙන් සටන්කාමීත්ව වලක්වාලීමේ හමාස් ප්‍රයත්නයන්ට හරස් කැපීම පිලිබඳව ඔහු ඊශ්‍රායෙල් ආන්ඩුවට දෝශාරෝපනය කලේ ය. ඔහු මෙසේ පැවසී ය: "අප දේශපාලන සම්මුතියකට විරුද්ධවන්නේ නැත. අපගේ ගැටලු සාමකාමී අයුරකින් විසඳිය හැකි නම් අපි එයට විරුද්ධ නොවෙමු.... ගැටලුව පවතින්නේ ඊශ්‍රායෙලය පැත්තේ ය. කථා කිරීමට හැකි පලස්තීන කොටස්කරුවකු සිටින බව ඒත්තු ගැනීමට ඔවුන්ට අවශ්‍ය නැත."

ෆාටාවද කිසිදු ක්‍රියාවකට නැංවිය හැකි විකල්පයක් ඉදිරිපත් කරන්නේ නැත. මෙවන් මංමුලා සහගත ප්‍රහාරයන් ඇවිලවූ සියොන්වාදී මර්දනයට හා ආක්‍රමනයට දන නැමීම පිලිබඳව දේශපාලන වගකීමේ තමන්ද කොටස්කරුවකු වන නමුදු පලස්තීන ජනාධිපති මෙහොමඩ් අබ්බාස් තෙල්අවීව් බෝම්බ ප්‍රහාරය හෙලා දැක ඊට සම්බන්ධිතවූවන් අත් අඩංගුවට ගන්නා බවට දිවුරා සිටියේ ය.

අබ්බාස් යනු, යුරෝපීය සංගමයෙන්, ඇමරිකාවෙන් සහ විවිධාකාර ජාත්‍යන්තර ඒජන්සිවලින් පලස්තීන අධිකාරියට බිලියන ගනන් ලබාදුන් ඔස්ලෝ ගිවිසුම යටතේ ඇටවුන ව්‍යුහයන් ගසා කැමෙන් තමන්ව ඉසුරුමත් කර ගත් පලස්තීන ධනේශ්වර කොටසේ දේශපාලන නියෝජිතයා ය. යුරෝපා සංගමය, එක්සත් ජාතීන් හා බුෂ් පරිපාලනය සමග කුමන්ත්‍රනකාරීව හවුල්වීමෙන් යලි බලයට ඒමට ෆාටා නායකත්වය බලාපොරොත්තු වේ.

මේ අතරවාරයේ වාඩි ලා ගත් බටහිර ඉවුරේ හා ගාසා තීරයේ ලේ වහනය දිගට ම සිදු වෙයි. ගිය සතියේ එල්ල වුන ඊශ්‍රායෙල කාල තුවක්කු හා ගුවන් ප්‍රහාර මගින් අඩු ගනනේ ගාසා පලස්තීනුවන් 16 දෙනෙක් මරා දැමුන අතර ඊශ්‍රායෙල ආන්ඩුව මෙම සියලු ප්‍රහාර යුක්ති යුක්ත කලේ, දකුනු ඊශ්‍රායෙලයට එල්ල වූ රොකට් ප්‍රහාරයන්ට ප්‍රති ප්‍රහාර එල්ල කිරීම් ලෙස ය. එම රොකට් ප්‍රහාර මගින් කිසිවකුත් මරනයට පත් නොවුනි.

එසේම ඊශ්‍රායෙල් ආන්ඩුව නැගෙනහිර ජෙරුසලමේ ඡන්ද කොට්ඨාස නියෝජනය කරන හමාස් නිලධාරීන් සිවු දෙනෙකුගේ නේවාසික අයිතිය අහෝසි කලේ ය. මේ නිසා ඔවුන්ට වාඩි ලා ගත්

නගරය තුල ගමන් කිරීමට අවශ්‍ය වන හැඳුනුම් පත් අහිමි වන අතර ඔවුන්ට බටහිර ඉවුරේම රැඳී සිටීමට බල කෙරෙනු ඇත.

මෙම පියවර, නැගෙනහිර ජෙරුසලමේ මෙන්ම බටහිර ඉවුරෙහි කොටසකින් ද පලස්තීන ජනයා පලවා හැරීමේ හා යුදෙව් පදිංචිකරුවන්ගෙන් ඒ තැන් පිරවීමේ විශාල සියොන්වාදී ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ජෙරුසලම් පලස්තීනුවන්ට ඔවුන්ගේ නේවාසික අයිතීන් අහිමි කිරීමේ තව තවත් පුලුල් ක්‍රියාකාරකම් සඳහා පූර්වාදර්ශයක් ඇති කිරීම පිනිස ය, යනුවෙන් අනතුරු ඇඟවීම් විය.

බුෂ් පරිපාලනය තෙල් අවිව් ප්‍රහාරය පිලිබඳව පෙර දැකිය හැකි ආකාරයේ හෙලා දැකීමක් වොෂිංටනයේ සිට නිකුත් කලේ ය. මේ සිය කැරලි මැඩීමේ ව්‍යාපාරයේදී දස දහස් ගනනින් ඉරාක ජාතිකයන් සමූලඝාතනය කලා වූ ද පලස්තීන මරාගෙන මැරෙන බෝම්බකරුවන් භාවිතා කරන නොදියුනු බෝම්බ අඟුටුමිටි කරවන තරමින් ඉරාක නගර හා ගම්මානවලට නිතිපතා බෝම්බ හෙලන්නා වූ ද ආන්ඩුවකි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී ඉරාක නියෝජිත ඩෑන් ගිලර්මන්, සිරියාව, ඉරානය සහ හමාස් පාලිත පලස්තීන අධිකාරිය "ත්‍රස්තයේ අක්ෂය"ක් බව ප්‍රකාශ කරමින් බුෂ්ගේ කුප්‍රකට "දුෂ්ටත්වයේ අක්ෂය" කථාව දෝංකාර දෙව්වේ ය. ඊස්රායෙලයේ හා ඇමරිකාවේ යන දෙතැනම දක්ෂිනාංශික මුද්‍රිත මාධ්‍ය ඉරානයට විරුද්ධ සිය යුද ව්‍යාපාරය වෙනුවෙන් මෙම ප්‍රහාරය ගසා කෑම පිනිස එයට ඉරානය ඈඳීම සඳහා කිසිදු සාක්ෂ්‍යයක් ඉදිරිපත් නොකරම -- මාන බලයි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය පලස්තීන ජනයාට* එරෙහි අධිරාජ්‍යවාදයේ හා සියොන්වාදයේ අපරාධයන්ට විරුද්ධ ය. 1967 යුද්ධයේ දී අල්ලා ගත් භූමිය පමනක් නොව 70,000ක් පලස්තීනුවන් සිය නිවාසවලින් පලවා හැරුන සහ 400ක් ගම්මාන පිසදා දැමුන, 1948 සියොන්වාදී රාජ්‍යය මුලින්ම පිහිටුවීමේ දී සිට ම, ඊස්රායෙලය පලස්තීන භූමිය නීති විරෝධීව අල්ලා ගෙන සිටී. අධිරාජ්‍යවාදී බලවතුන් සමග තමන්ගේ හොර ගනුදෙනු සඳහා කේවලයක් ලෙස පලස්තීනුවන් යොදා ගනිමින් නැවත නැවතත් පලස්තීන ජාතික අරගලය පාවාදුන් අරාබි ධනේශ්වරයේ අපරාධයන් ද මීට එකතු කල යුතුය.

කෙසේ වෙතත්, පලස්තීන ජනයා ආරක්ෂා කර ලීම, එම ජනයා මර්දනය කිරීමේ මූලය වසයෙන් පවතින ධනේශ්වර ක්‍රමය පිලිගන්නා ජාතිකවාදී වැඩපිලිවෙලක් මත පදනම්ව ඉටු කල නොහැක. එසේම එය, වගවිභාගයක් නැති ත්‍රස්ත බෝම්බ වැනි කම්කරු ජනයා අතර අලා මුලාව සහ භේද බින්නය පතුරුවන විධික්‍රම හා උපක්‍රම මත ද පදනම් කල නොහැක. මැද පෙරදිගට ඇති ඉදිරි මාවත නම්, සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත මේ සියලු රටවල ධනේශ්වර පාලකයන්ට හා ඔවුන්ගේ අධිරාජ්‍යවාදී අනුග්‍රාහකයින්ට එරෙහිව, අරාබි, යුදෙව්, කුර්ද් හා තුර්කි ආදී සියලු ජාති හා සංස්කෘතීන්ට අයත් කම්කරුවන්ගේ එක්සත් අරගලයක් වර්ධනය කිරීම ය.

© www.wsws.org